# වෙරළබඩ සංචාරක කර්මාන්තයේ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

බී.ජී.ටී.ඩී. බණ්ඩාර[1], එස්.එම්.එම්.එච්. සමරකෝන්[2]

ලෝක ආර්ථිකයේ නවතම තරඟකාරී ක්ෂේත්‍රයක් ලෙස සංචාරක කර්මාන්තය හඳුනාගත හැකිය. ලෝක සංචාරක සංවිධානයට අනුව 2018 වසර තුළ දී බිලියන 1.4 ක ප්‍රමාණයක් ජාත්‍යන්තර සංචරණය සඳහා යොමු වී ඇත. ශ්‍රී ලංකාව තුළ විශාලතම ආදායම් උපයන කර්මාන්තයක් බවට සංචාරක කර්මාන්තය පත්ව තිබේ. Lonely Planet සඟරාව සහ travellemming වෙබ් අඩවියට අනුව 2018-2019 වසරේ ලෝකයේ හොඳම සංචාරක ගමනාන්තය බවට ශ්‍රී ලංකාව නම්කර ඇත. මේ අනුව ශ්‍රී ලංකාවේ සංවර්ධනය හා ආර්ථිකය තුළ සංචාරක කර්මාන්තය ප්‍රමුඛත්වයක් ගනු ලබන අතර ඒ තුළ වෙරළබඩ සංචාරක කර්මාන්තය ප්‍රධානතම කලාපයක් ලෙස හඳුනාගත හැකිය. වෙරළබඩ සංචාරක කර්මාන්තයේ ආර්ථික බලපෑම කෙබඳු ද යන්න මෙම අධ්‍යයනයේ මූලික ගැටලුව වේ. මෙම ගැටලුව මත පදනම්ව වෙරළබඩ සංචාරක කර්මාන්තයේ ආර්ථික බලපෑම ප්‍රදේශය තුළ හැසිරෙන ආකාරය හඳුනාගැනීම මෙම අධ්‍යයනයේ අරමුණු වේ. මේ සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස ආරුගම්බේ ප්‍රදේශය බහුරූපිය පොකුරු නියැදීම තුළින් තෝරාගත් අතර ප්‍රතිචාරකයින් 50 දෙනෙකුගෙන් සමන්විත නියැදියක් ඒ තුළින් ලබාගන්නා ලදී. ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගනිමින් දත්ත රැස්කරන ලදි. දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක සංඛ්‍යානය ශිල්ප ක්‍රමයන් යොදාගෙන ඇත. ඒ අනුව කුටුම්භ ආදායම කෙරෙහි සංචාරක කර්මාන්තයෙන් උපයන ආදායම ධන බලපෑමක් කරන බව තහවුරු විය ($r = 0.884, p = 0.000$). සංචාරක කර්මාන්තය හේතු කරගෙන ඇති සෘජු හා වක්‍ර රැකියාවන් හඳුනාගැනීමේ දි 79% ක් පමණ විශාල සේවා නියුක්තිකයින් ප්‍රමාණයක් හෝටල් ක්ෂේත්‍රය ආශ්‍රිතව රැකියාවල නියුතු බව තහවුරු විය. හෝටලය ආරම්භක වර්ෂය හා වර්තමාන තත්ත්වය සංසන්දනය කිරීමේ දි සංචාරක කර්මාන්තයේ සේවා නියුක්තිය 61% ක් දක්වා වර්ධනය වී ඇති බව අනාවරණය විය. ඉඩම් මිල ව්‍යාප්තියේ වෙනස්කම් හඳුනාගැනීමේ දි 2005 න් පසු කාලයේ දි ඉඩම් මිල ඉහළ යාමක් දැකගත හැකි වූ අතර එයට හේතු වූයේ සුනාමියෙන් පසු ඇති වූ සංවර්ධනය හා 2009 න් පසු යුද්ධය අවසන් වීම නිසා ඇති වූ තත්ත්වයන්ය. ප්‍රදේශයේ යටිතල පහසුකම් සැලකීමේ දී සනීපාරක්ෂාව පිළිබඳව රජය වැඩි අවධානයක් යොමු කළ යුතු අතර ඉන් සංචාරකයින්ගේ ආකර්ෂණය තවත් වැඩි කරගත හැකිය. සංචාරක ක්‍රියාකාරි නොවන කාලය තුළ කුඩා පරිමාණයේ සංචාරක ව්‍යාපාර විශාල වශයෙන් උච්ඡාවචනයට ලක්වන අතර ඔවුන්ව දිරිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කෙරෙහි රජය අවධානය යොමුකළ යුතු ය.

ප්‍රමුඛ පද : සංචාරක කර්මාන්තය, වෙරළබඩ, ආර්ථික බලපෑම

[1] සමාජ සංඛ්‍යානය අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. bandarathusithad@gmail.com
[2] ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය harinisamarakoon95@gmail.com